

කාර්ය සාධන වාර්තාව
செயல் திறன் அறிக்கை
PERFORMANCE REPORT
2020





ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
இலங்கை புகையிரத திணைக்களம்
SRI LANKA RAILWAY DEPARTMENT



කාර්ය සාධන වාර්තාව - 2020

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

පටුන

පිටු අංකය

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය 1

1.1 හැඳින්වීම 1

1.2 ආයතනයේ දැක්ම , මෙහෙවර , අරමුණු 2

1.3 ප්‍රධාන කාර්යයන් 3

1.4 සංවිධාන සටහන 4

1.5 ශ්‍රී ලංකා ඩුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන උප දෙපාර්තමේන්තු , අංශ හා ඒකක හා මාර්ග ජාලය 6

1.6 ශ්‍රී ලංකා ඩුම්රිය දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන / අරමුදල් 7

1.7 විදේශාධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු 8

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම 9

විශේෂ ජයග්‍රහන , අභියෝග හා ඉදිරි දැක්ම

03 පරිච්ඡේදය - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය 20

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය 20

3.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය 22

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 24

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන 26

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය 26

3.6 වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 26

3.7 මු.රෙ. 208 ප්‍රකාරව , වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු වල නියෝජිතයෙක් ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 26

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 27

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව 35

04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශකය 28

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 28

05 පරිච්ඡේදය - තිරසාර සංවර්ධන අරමුණු (SDG) පසුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණු 29

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 29

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 31

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලබන ආකාරය 31

6.3 මානව සම්පත් සංවර්ධනය 31

07 පරිච්ඡේදය -අනුකූලතා වාර්තාව 32

01 පරිච්ඡේදය

1.1 හැදින්වීම

ශ්‍රී ලාංකීය ප්‍රවාහන පද්ධතියේ පුරෝගාමී මෙහෙවරක් සිදු කරන ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව 1864 දෙසැම්බර් 26 වන තම ප්‍රථම මංගල ගමන සනිටුහන් කිරීමෙන් ආරම්භ කරන ලද තම මෙහෙවර වසර 157 ක් පුරාවට සිදු කරමින් පවතී.

ප්‍රධාන ප්‍රවාහන සැපයුම් මාධ්‍යයක් ලෙස ශ්‍රී ලංකා දුම්රිය සේවය 2020 වර්ෂයේදී ආර්ථික වර්ධනය සඳහා දායකත්වයක් දක්වමින් තම සේවා කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යන ලදි. 2020 වර්ෂයේදී මගී හා භාණ්ඩ ප්‍රවාහන කටයුතු වල අඛණ්ඩ මෙහෙවරක යෙදෙමින් පරිසර හිතකාමී හා පිරිමැසුම්දායී ප්‍රවාහන මාධ්‍යයක් ලෙස තම සේවා කටයුතු කාර්යක්ෂමව ලබා දීමට කටයුතු කරයි.

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව රජයේ ප්‍රධාන දෙපාර්තමේන්තුවක් ලෙස ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.මෙම දෙපාර්තමේන්තුව දුම්රිය ආඥා පනතේ ඇති විධිවිධානයන්ට යටත්ව කටයුතු ක්‍රියාත්මක කරනු ලබන අතර දුම්රිය සාමාන්‍යාධිකාරී දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා ලෙස කටයුතු කරයි. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ශාඛා හා ඒකක 14 ක් යටතේ පරිපාලනය කටයුතු විමධ්‍යගතවී තිබෙන අතර අදාල උප දෙපාර්තමේන්තුවේ, ශාඛාවේ ඒකකයේ ප්‍රධානියා විසින් පැවරී ඇති කාර්යයන් ක්‍රියාත්මක කරනු බලයි.

රටේ සමස්ථ දිස්ත්‍රික්ක 25 න් දිස්ත්‍රික්ක 21 ක් ආවරණය වන පරිදි මාර්ග කිලෝමීටර් 1,478.52 දිගු දුරකින් යුතුව සමස්ථ දුම්රිය ස්ථාන 418 සමඟ මගී ජනතාවගේ ප්‍රවාහන පහසුකම් සැපයීම සිදු කරනු ලබයි. තම මුඛ්‍ය පරමාර්ථය වූ මගී හා භාණ්ඩ ප්‍රවාහනය සඳහා ආරක්ෂිත, විශ්වාසදායි, නියමිත වේලාවට ධාවනය වන සකසුරුවම් හා කාර්යක්ෂම දුම්රිය ප්‍රවාහන සේවාවක් සැපයීම හා පරිසර හිතකාමී හා පිරිමැසුම්කාරී ප්‍රවාහන මාධ්‍යයක් ලෙස තම සේවා කටයුතු වඩා කාර්යක්ෂම ලෙස ඉටු කිරීමට ඉහළ කැපවීමකින් කටයුතු කරනු ලැබීය. 2020 වර්ෂයේදී ද විවිධ බාධක හා අභියෝගයන් මධ්‍යයේ වුවද තම සේවා කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යෑමට හැකි විය.

ලොවම වෙලාගත් කොරෝනා වසංගත තත්වයේ බලපෑම ශ්‍රී ලංකාව තුළද දක්නට ලැබුණු අතර 2020 මාර්තු මස සිට අප්‍රේල් , මැයි , ජුනි මස දක්වා රට වරින් වර වසා දමන ලදී. එමෙන්ම සියළුම දුම්රිය ගමන් වාරයන් සීමා වූ අතර ජූලි , අගෝස්තු සැප්තැම්බර් , ඔක්තෝබර් මාසවල සීමාසහිත තත්වයන් තුළ දුම්රිය ධාවනය සිදුවූ අතර නැවතත් ඔක්තෝබර් , නොවැම්බර් , දෙසැම්බර් මාසයන් වල වරින් වර රටේ කලාප වශයෙන් තෝරා වැසීම තුළ දුම්රිය ගමනාගමනය ද ඇනහිටින ලදි. ඒ තුළ ඉතා සීමිත දුම්රිය වාර සංඛ්‍යාවක් පමණක් ධාවනයට එක් කරන ලදී. එමෙන්ම වඩා සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේදයන්ට අනුව මගී ප්‍රවාහනය සිදු කරනු ලැබූ හෙයින් දුම්රියේ ගමන් කරනු ලැබූ මගී ප්‍රමාණයද ඉතා සිමාසහිත විය. මෙම කොරෝනා තත්වය 2020 වසරේ මගී ප්‍රමාණය හා දුම්රිය ආදායම අඩුවී තිබීම සඳහා ප්‍රධාන සාධකයක් විය.

මෙවැනි විවිධ බාධක හමුවේ වුවද මගී ජනතාව සඳහා කාර්යක්ෂම හා සුවපහසු දුම්රිය සේවාවක් ලබාදීම සඳහා ක්‍රියාමාර්ග රාශියක් ගනු ලැබීය. ඒ තුළ චීනයෙන් හා ඉන්දියාවෙන් ආනයනය කරන ලද නවීන දුම්රියන් දුර ගමන් සේවා සඳහා යෙදවීම, නව දුම්රියන් හඳුන්වාදීම ආදිය මගින් මගී ජනතාවගේ ප්‍රවාහන අවශ්‍යතාවය සපුරා ගැනීමට ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව යුහුසුළුව කටයුතු කරන ලදී .

දැක්ම

ශ්‍රී ලංකාවේ මගී හා භාණ්ඩ ප්‍රවාහනයේ
වඩාත් විශ්වසනීය
ප්‍රවාහන සැපයුම්කරු බවට පත්වීම

මෙහෙවර

මගී හා භාණ්ඩ ප්‍රවාහනය සඳහා
ආරක්ෂිත, විශ්වාසදායි
හා කාර්යක්ෂම
දුම්රිය ප්‍රවාහන සේවාවක් සැපයීම

අරමුණු

- දුම්රිය මගී හා භාණ්ඩ ප්‍රවාහන අංශයන්හි දායකත්වය වර්ධනය කිරීම
- දුම්රිය මෙහෙයුම් වල ආරක්ෂාව තහවුරු කිරීම
- මගී දුම්රිය සේවාවන්හි ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම
- දුම්රිය කාර්ය මණ්ඩලයේ හා සම්පත් භාවිතයේ ඵලදායීබව වර්ධනය කිරීම
- දුම්රිය ආදායම වැඩි කිරීම
- මානව සම්පත සංවර්ධනය කිරීම
- දුම්රිය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම

1.3 ප්‍රධාන කාර්යයන්

- මගී ප්‍රවාහන කටයුතු ක්‍රියාත්මක කිරීම
- භාණ්ඩ ප්‍රවාහනය සිදු කිරීම
- විශේෂ මගී දුම්රිය සේවා ක්‍රියාත්මක කිරීම

1.4 සංවිධාන ව්‍යුහය


GENARAL MANAGER RAILWAY
A.G.M (A)
DGM
D(A)
ADA
LGO
A.G.M. (M)
DGM(T)
CEMO
CEM
DCET
DEMO
DEM
DEME
SEM
SEME
ET
EM
ATM
ATE
EE
CM
EW
A.G.M. (I)
CE(W)
CE(S)
DEW
DEBR
DEBU
SEW
SS
S
DES
SES
SEP
ES
EP
A.G.M. (O)
DGM C
DGMT
SC
MAR
ST
AC
AST
C.F.O
CA
AC
DEC P&P
SE P&P
E P&P
CIA
DIT
ADE
SRP
DSRP
ASRP
DGMP
SP
ASP
D P
ADP

Level 2 **AGM(A)** – Addl. General Manager(Admin) , **AGM(M)** - Addl. General Manager(Mechanical), **A.G.M. (I)** - Addl. General Manager(Infrastructure), **A.G.M. (O**)- Addl. General Manager(Operation), **C.F.O** – Chief Finance officer

Level 3 **DGM**-Deputy General Manager (Admin) , **DGM(T**) - Deputy General Manager (Training & HR) , **CEM** – Chief Engineer (Motive Power), **CME**- Chief Mechanical Engineer, **CE(W)** Chief Engineer (Way & works), **CSTE-** Chief Engineer (Signal & Telecommunication), , **DGM(C**) - Deputy General Manager (Commercial) , **DGMT**- Deputy General Manager (Transport) , **CIA**- Chief Internal Auditor , **CA**- Chief Accountant , SRP- Superintendent(RP) , **DGMP** - Deputy General Manager (Procurement) , **D P** – Director (Planning)

Level 4 **D(A)**-Director (Admin) , **DCET** - Deputy Chief Engineer (Training & HRB), **DEMO** - Deputy Chief Engineer (Motive Power), **DEM**- Deputy Chief Engineer (Mechanical), **DEME** - Deputy Chief Engineer (Electrical) , **DEW** - Deputy Chief Engineer (Way & Works) , **DEBR** - Deputy Chief Engineer (Way & Bridges), **DEBU** - Deputy Chief Engineer (Property Development & Building) , **DES** - Deputy Chief Engineer (Signal & Telecommunication), **SC** – Superintendent Commercial , **ST** – Superintendent Transportation

Level 5 **SEM** – Superintendent Engineer (Motive Power), **SEME** - Superintendent Engineer (Mechanical), **SEW** - Superintendent Engineer (Way & works), **SS** – Surveyor Superintendent , **SES** - Superintendent Engineer (Signal & Telecommunication), **SEP** - Superintendent Engineer (Planning Project) , **DSSM** – Deputy Superintendent (Sales & Marketing) , **DIT** - Deputy Director (Information Technology) , **DSRP** - Deputy Superintendent (R.P) , **SP** – Superintendent (Procurement)

Level 6 **ADA** – Assistant Director (Admin) / Deputy Director (Admin), **LGO** – Legal Officer , **ET** – Engineer (Training & HRB) , **EM** – Engineer (Motive Power), **ATM** – Asst. Transportation Superintendent (Mechanical) , **ATE** - Asst. Transportation Superintendent (Energy Conservation) , **EM** – Engineer (Mechanical), **EE** – Engineer (Electrical) , **CM** – Chemist & Methodologist , **EW** – Engineer (Way & Works) , **S** – Surveyor , **ES** – Engineer (Signaling & Telecommunication) , **EP** – Engineer (Planning & Project) , **AC** – Asst. Director / Deputy Director (Cost) , **AST** – Asst. Superintendent (Transportation / Commercial) , **AC** – Accountant , **ADI** – Asst. Director (Information Technology) , **ASRP**-Asst. Superintendent (R.P), **ASP** – Asst. Superintendent (Procurement), **ADP** – Asst. Director (Planning)

1.5 ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ උප දෙපාර්තමේන්තු , අංශ හා ඒකක හා මාර්ග ජාලය

උප දෙපාර්තමේන්තු , අංශ හා ඒකක

#	උප දෙපාර්තමේන්තු/ඒකක	දෙපාර්තමේන්තුව / උප දෙපාර්තමේන්තු/ඒකක ප්‍රධානීන්
01	දුම්රිය සාමාන්‍යාධිකාරි කාර්යාලය	දුම්රිය සාමාන්‍යාධිකාරී
02	ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු උප දෙපාර්තමේන්තුව	ප්‍රධාන ඉංජිනේරු (යාන්ත්‍රික)
03	ප්‍රධාන ඉංජිනේරු (මාර්ග/කර්මාන්ත) උප දෙපාර්තමේන්තුව	ප්‍රධාන ඉංජිනේරු (මාර්ග/කර්මාන්ත)
04	ප්‍රධාන ඉංජිනේරු (ධාවන බල) උප දෙපාර්තමේන්තුව	ප්‍රධාන ඉංජිනේරු(ධාවන බල)
05	ප්‍රධාන ඉංජිනේරු (සංඥා සහ විදුලි සංදේශ) උප දෙපාර්තමේන්තුව	ප්‍රධාන ඉංජිනේරු (සංඥා හා විදුලි සංදේශ)
06	ගණකාධිකාරි උප දෙපාර්තමේන්තුව	ප්‍රධාන මූල්‍ය නිලධාරි
07	වාණිජ උප දෙපාර්තමේන්තුව	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (වාණිජ)
08	දුම්රිය ගබඩා උප දෙපාර්තමේන්තුව	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි(ප්‍රසම්පාදන)
09	ගමනාගමන උප දෙපාර්තමේන්තුව	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි(ගමනාගමන)
10	ශ්‍රී ලංකා දුම්රිය ආරක්ෂක සේවය	ආරක්ෂක අධිකාරි
11	ශ්‍රී ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (පුහුණු හා මානව සම්පත්)
12	ප්‍රධාන පිරිවැය නිලධාරි කාර්යාලය	ප්‍රධාන පිරිවැය නිලධාරි
13	සැලසුම් ඒකකය	අධ්‍යක්ෂ (සැලසුම්)
14	දත්ත සැකසුම් ඒකකය	කළමනාකරු දත්ත සැකසුම්

වගු අංක 01

දුම්රිය මාර්ග ජාලය

මාර්ගය	දුර කි.මී	දුම්රිය ස්ථාන සංඛ්‍යාව	උප දුම්රිය ස්ථාන සංඛ්‍යාව	දුම්රිය හෝල්ට්
මුහුදුබඩ මාර්ගය (කොළඹ කොටුව සිට බෙලිඅත්ත දක්වා)	186	41	33	0
ප්‍රධාන මාර්ගය (කොළඹ කොටුව සිට බදුල්ල දක්වා)	292.38	45	33	26
මාතලේ මාර්ගය (පේරාදෙණියේ සිට මාතලේ දක්වා)	33.75	06	06	12
පුත්තලම් මාර්ගය (රාගම සිට පුත්තලම දක්වා)	119.57	19	25	0
පුත්තලම අරුවක්කාලු මාර්ගය	37.00	1		
කැලණිවැලි මාර්ගය (මරදාන සිට අවිස්සාවේල්ල දක්වා)	59.27	11	19	7
වරාය මාර්ගය	7.00	1	-	-
කොලොන්නාව මාර්ගය	3.18	1	-	-
උතුරු මාර්ගය (පොල්ගහවෙල සිට කන්කසන්තුරය දක්වා)	339.47	31	26	17
තලෙමන්නාරම් මාර්ගය (මැදවච්චියේ සිට තලෙයිමන්නාරම දක්වා)	106.06	07	04	0
මිහින්තලේ මාර්ගය	13.50	01	0	2
මඩකලපු මාර්ගය (මහව සිට මඩකලපුව දක්වා)	211.11	14	17	05
ත්‍රිකුණාමල මාර්ගය (ගල්ඔය හංදියේ සිට ත්‍රිකුණාමලය දක්වා)	70.23	04	02	02
එකතුව	**1,478.52**	**182**	**165**	**71**

වගු අංක 02

1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන / අරමුදල්

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව යටතේ වෙනත් ආයතන හෝ අරමුදල් නොමැත

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

විදේශ ආධාර ලබන ව්‍යාපෘති

	ව්‍යාපෘතියේ නම	ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම ඇ.ඩොරු.මි	ව්‍යාපෘති කාල සීමාව	විස්තරය
1	මගී මැදිරි 160 ක් මිලදී ගැනීම (ඉන්දියානු ණය ආධාර)	86.000	2018.09.07 2020.12.07 (මාස 27)	පළමු මැදිරි 10 2021 අප්‍රේල් මාසයේ ලංකාවට ගෙන්වීමට නියමිතය
2	දුම්රිය එන්ජින් 12 ක් මිලදී ගැනීම (USD)	48.67		ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ
3	උඩරට දුම්රිය මාර්ගය සඳහා බලවේග කට්ටල 09 ක් මිලදී ගැනීම (චීනය)	93.86	2018. සැප්තැම්බර් සිට 2020.මැයි (මැයි 20)	ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.
4	පොල්ගහවෙල කුරුණෑගල ද්විත්ව දුම්රිය මාර්ගය ඉදිකිරීම(21.45Km)	52.00.	වසර 2	ඉන්දියන් ආධාර යටතේ ආරම්භ කිරීමට නියමිතය
5	මහව ඕමන්තේ දුම්රිය මාර්ගය පුනරුත්ථාපනය ඉදිකිරීම(129.77Km)	91.268	වසර 3	- ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

වගු අංක 03

02 පරිච්ඡේදය

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය හා ඉදිරි දැක්ම.....

දුම්රිය ප්‍රවාහනය කාර්යක්ෂම ආරක්ෂාකාරී සකසුරුවම් හා පරිසර හිතකාමී ප්‍රවාහන මාධ්‍යයක් ලෙස පිළිගෙන ඇත. ශ්‍රී ලංකාවේ මගී හා භාණ්ඩ ප්‍රවාහන කටයුතු සඳහා දායකත්වය ලබා දෙන ප්‍රධාන ප්‍රවාහන පාර්ශවකරුවකු ලෙස ශ්‍රී ලංකා දුම්රිය සේවය ප්‍රවාහන සේවා කටයුතු වල නියැලෙමින් සිටී. වර්තමානයේ මගී ප්‍රවාහන කටයුතු සඳහා වැඩි නැඹුරුතාවයකින් කටයුතු කරන ශ්‍රී ලංකා දුම්රිය සේවය කාර්යාල සේවා , දුර ගමන් සේවා , නගරාන්තර දුම්රිය සේවා විශේෂ සංචාරක හා ආගමික කටයුතු සඳහා ක්‍රියාත්මක වන විශේෂ දුම්රිය සේවා පවත්වාගෙන යනු ලබයි. ශ්‍රී ලංකා ආර්ථිකයේ දළ දේශීය නිෂ්පාදිතයේ සේවා අංශයේ අභිවෘද්ධිය සඳහා දායකත්වය ලබා දෙමින් විවිධ අභියෝගයන් හා ගැටළු හමුවේ වුවද වඩා කාර්යක්ෂම දුම්රිය සේවයක් සැපයීම වෙනුවෙන් අඛණ්ඩ ප්‍රයත්නයක නියැලි සිටී.

2020 වර්ෂයේ මුල් කාර්තුවේ සිට ඉස්මතු වූ කොවිඩ් වසංගත තත්වය හමුවේ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සියළු දුම්රිය මෙහෙයුම් කටයුතු වලට හා දෛනික ක්‍රියාකාරකම් සඳහා දැඩි බලපෑමක් සිදුවිය. කෙසේ වුවද එම අභියෝගය හා ගැටළු හමුවේ මගී හා භාණ්ඩ ප්‍රවාහන කටයුතු සඳහා උපරිම දායකත්වයක් ලබාදෙමින් ශ්‍රී ලංකා දුම්රිය සේවය අඛණ්ඩ මෙහෙවරක යෙදුණි.

2020 වර්ෂයේ පැවති තත්වය එසේ වුවද, සාමාන්‍ය තත්වය යටතේ දෛනිකව දුම්රිය ගමන් වාර 390 ක් හා එමඟින් දුම්රිය මඟින් ලක්ෂ 4 ක ආසන්න ප්‍රමාණයක මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබන අතර භාණ්ඩ දුම්රිය ගමන් වාර 03 ක් ද , තෙල් දුම්රිය ගමන් වාර 08 ක් ද , මෙහෙයුම් කටයුතු සිදු කරනු ලැබීය. 2019 වර්ෂයට සාපේක්ෂව දුම්රිය ගමන්වාර 41% ක අඩුවීමක් පෙන්නුම් කරන අතර එයට බලපාන ලද ප්‍රධාන හේතු සාධකය වූයේ රටේ පැවති කොරෝනා තත්වය මත දුම්රිය ගමන්වාර කිහිපයක් අවලංගු කිරීමයි . වර්ෂය තුළ මගී හා භාණ්ඩ ප්‍රවාහන ක්ෂේත්‍රයේ ගුණාත්මක වර්ධනයක් අපේක්ෂාවෙන් ඉන්දියානු ණය ආධාර ක්‍රමය යටතේ දුම්රිය ඇන්ජින් 10 ක් , බලවේග කට්ටල 06 ක් හා මගී මැදිරි 160 ක් , තෙල් ටැංකි 30 ක් හා කන්ටේනර් වැගන් 20 ක් මිලදී ගැනීමේ කටයුතු ක්‍රියාත්මක කරනු ලැබීය. ඉහත ප්‍රසම්පාදනයන්ට සමගාමීව උඩරට දුම්රිය මාර්ගයේ ධාවනය වැඩි දියුණු කිරීම සඳහා බලවේග කට්ටල 09 ක් මිලදී ගැනීම මෙන්ම සේවයෙන් ඉවත් කරන ලද මගී මැදිරි 200 ක් පුනරුත්ථාපනය කිරීම හා ආරක්ෂක දුම්රිය හරස් මාර්ග පද්ධති 200 ක් ස්ථාපිත කිරීම ආදී දුම්රිය සේවයේ දියුණුව හා මගී ජනතාවගේ ගමන් පහසුව සඳහා ක්‍රියාත්මක කරනු ලැබූ ප්‍රධාන දුම්රිය සංවර්ධන ව්‍යාපෘතීන් වේ. තවද ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය ආධාර යටතේ කොළඹ තදාසන්න දුම්රිය සේවය වැඩි දියුණු කිරීම සඳහා ශක්‍යතා අධ්‍යනයක් සිදුකර එම ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කර තිබෙන අතර දුම්රිය සේවයේ අභිවෘද්ධිය සඳහා ප්‍රධාන සැලැස්මක් පිළියෙල කිරීමද (Railway Master Plan) ආසියානු සංවර්ධ බැංකුවේ මූල්‍ය ආධාර යටතේ ක්‍රියාත්මක වේ.

තවද මගී හා භාණ්ඩ දුම්රිය ප්‍රවාහන කටයුතු වල ගුණාත්මකභාවය තවදුරටත් වර්ධනය කිරීම සඳහා මහව සිට ඕමන්ත දක්වා දුම්රිය මාර්ගය පුනරුත්ථාපන කටයුතු ක්‍රියාත්මක කිරීම ආදී කටයුතු දුම්රිය සංවර්ධනය සඳහා 2020 වසර තුළ ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ව්‍යාපෘති වේ.

තවද මුහුදුබඩ දුම්රිය මාර්ගයේ දකුණු පයාගල සිට අළුත්ගම දක්වා ද්විත්ව දුම්රිය මාර්යේ මූලික කටයුතු ආරම්භ කිරීම හා පුත්තලම දුම්රිය මාර්ගයේ කුරණෑ හා මීගමුව අතර ද්විත්ව දුම්රිය මාර්ගයේ වැඩ කටයුතු සිදු කරමින් පවතිනු ලබන අතර එය 2021 අවසන් කිරීමට නියමිතය. ඊට අමතරව දුම්රිය එන්ජින් 10 ක් ආනයනය කර සේවය සඳහා යොදවන ලදී. උඩරට දුම්රිය මාර්ගය සඳහා චීනයෙන් මිලදි ගත් බලවේග කට්ටල් 9 ආනයනය කර උඩරට දුම්රිය මාර්ගයේ ධාවනය සඳහා එක් කරන ලදී.

2020 වර්ෂයේදී මගීන් මිලියන 65.08 ක් ගමන් කල අතර මගී කිලෝමීටර් මිලියන 3,905.55 ක දුර ප්‍රමාණයක් ධාවනය කර ඇත. එමෙන්ම භාණ්ඩ ටොන් මිලියන 1.78 ක් ප්‍රවාහනය කරමින් හා භාණ්ඩ ටොන් කිලෝමීටර් මිලියන 114.37ක් ධාවනය කරමින් ශ්‍රී ලංකා දුම්රිය සේවය සිය අඛණ්ඩ දායකත්වය ලබා දුනි. තවද වර්ෂයේ මුළු ආදායම 42.20% කින් පහත වැටුනු අතර ඒ තුළ මගී ප්‍රවේශපත් ආදායම 45% ක සැලකිය යුතු අඩුවීමක් පෙන්නුම් කරයි.

මෙම වර්ෂයේදී වසර පුරා වරින් වර පැවති කොරෝනා තත්වය හේතුවෙන් දුම්රිය ගමන්වාර ප්‍රමාණය සීමා සහිතව සිදුකරගෙන යන ලදි. මේ නිසා දුම්රිය සේවා ආරම්භ කිරීම මෙන්ම සේවාවන් දීර්ඝ කිරීම සිදු නොකරන ලදී.

කොරෝනා තත්වය හමුවේ වුවද මගී හා භාණ්ඩ ප්‍රවාහන සේවා සැපයීම සඳහා දුම්රිය මාර්ගවල පවතින වේග සීමාවන් අවම කර ගනිමින් සේවක හිඟය, මූල්‍යමය ගැටළු, යටිතල පහසුකම් ආදී කරුණු සම්බන්ධයෙන් උපාය මාර්ගික විසඳුම් යොදමින් ජනතාවගේ වඩා විශ්වසනීය වුත් සුවපහසු වුත් දුම්රිය සේවාවක් සැපයීම සඳහා අඛණ්ඩ මෙහෙවරක යෙදුනි.

ඉදිරි දැක්ම

වර්තමාන රජයේ ප්‍රවාහන ප්‍රතිපත්තියේ මුඛ්‍ය පරමාර්ථය වන්නේ මාර්ග තදබදය සඳහා විසඳුම් ලබාදීමයි. ඒ අනුව මහා මාර්ගයේ ගමන් ගන්නා මගී හා භාණ්ඩ ප්‍රවාහන කටයුතු දුම්රිය වෙත යොමු කිරීම ප්‍රධාන අභිලාශයක් වේ. එහිදි "**සෞභාග්‍යයේ දැක්ම**" ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ දුම්රිය යටිතල පහසුකම් වර්ධනය කර ඉතා කාර්යක්ෂම හා සකසුරුවම් දුම්රිය සේවාවක් ලබාදීම ප්‍රධාන අරමුණ වේ. ඒ අනුව දුම්රිය ඉදිරි සැළසුම් මෙම පරමාර්ථය මුල් කර ගනිමින් සිදු කිරීමට අපේක්ෂා කෙරේ. මේ යටතේ වඩාත් ආකර්ෂණීය හා පරිසර හිතකාමී ප්‍රවාහන මාධ්‍යයක් ලෙස දුම්රිය සේවයේ පහත සඳහන් සාධනීය සංවර්ධනයන් සිදු කිරීමට අපේක්ෂා කෙරේ.

- කාර්යක්ෂම හා සුවපහසු දුම්රිය සේවාවක් පවත්වාගෙන යාම
- පානදුර- කොළඹ -වේයන්ගොඩ , රාගම - කටුනායක- මිගමුව සහ මරදාන- හෝමාගම යන දුම්රිය සේවා සඳහා විදුලි දුම්රිය පද්ධතියක් හඳුන්වා දීම හා සාමාන්‍ය දුම්රිය සේවා වලට අමතරව සුඛෝපභෝගි කාර්යාලිය දුම්රිය සේවාවක් ආරම්භ කිරීම
- දුම්රිය සේවාව නවිකරණය සඳහා නූතන තාක්ෂණික ක්‍රමවේද සහ ඩිජිටල්කරණය හඳුන්වා දෙමින් දුම්රිය ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම සහ ආසන වෙන් කිරීම සඳහා ඔන්ලයින් සේවාවක් සහ ඊ ප්‍රවේශපත්‍ර සහ ස්වයංක්‍රීය ඇතුළුවීමේ පිටවීමේ දොරටු ක්‍රමයක් හඳුන්වා දීම
- භාණ්ඩ ප්‍රවාහනය සඳහා අවශ්‍ය දුම්රිය එංජින් ආනයනය කිරීම සහ දුම්රිය තට්ටු දේශීයව ඉදිකිරීම හා කොළඹ , හම්බන්තොට , ත්‍රිකුණාමලය , කන්කසන්තුරය යන වරාය වල දුම්රිය මගින් භාණ්ඩ ප්‍රවාහනය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් වර්ධනය කිරීම
- දුම්රිය ස්ථාන හා බැඳුනු ප්‍රධාන නගරවල ඇති දුම්රිය ඉඩම් භාවිතයට ගෙන සාජ්ජු සංකීර්ණ , මූල්‍ය සේවා , හෝටල් . කාර්යාල , සිනමාශාලා , විනෝද මධ්‍යස්ථාන සහ තට්ටු නිවාස ආදියෙන් සමන්විත වාණිජ මධ්‍යස්ථාන බවට පත්කර දුම්රිය සේවාවේ ආදායම ඉහල නැංවීම

ඉදිරි සංවර්ධන ව්‍යාපෘති

01. මහව ඕමන්ත දුම්රිය මාර්ගය පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය
02. පොල්ගහවෙල සිට කුරුණෑගල දක්වා ද්විත්ව දුම්රිය මාර්ගය ඉදිකිරීම
03. කුරුණෑගල සිට මහව දක්වා ද්විත්ව දුම්රිය මාර්ගය ඉදිකිරීම.
04. පුත්තලම දුම්රිය මාර්ගයේ මීගමුව සිට කොච්චිකඩේ දක්වා ද්විත්ව දුම්රිය මාර්ගය ඉදිකිරීම
05. පැරණි කැළණි පාලම නැවත ඉදිකිරීම
06. දුම්රිය සේවය සඳහා ප්‍රධාන සැලැස්ම සකස් කිරීම
07. ඉලෙක්ට්‍රෝනික ප්‍රවේශපත්‍ර ක්‍රමයක් හඳුන්වාදීම
08. මගී මැදිරි නිෂ්පාදනය ආරම්භ කිරීම
09. නව දුම්රිය සංඥා පද්ධතියක් ස්ථාපිත කිරීම
10. ආරක්ෂිත දුම්රිය හරස්මාර්ග පද්ධතියක් ස්ථාපිත කිරීම
11. මගී මැදිරි 200 ක් පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතියේ දිගුවක් ලෙස තවත් මැදිරි 100 ක් පුනරුත්ථාපනය කිරීම
12. දකුණු පයාගල - අළුත්ගම දක්වා දුම්රිය මාර්ගය ද්විත්වකරණය කිරීම
13. ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය දායකත්වය යටතේ ක්‍රියාත්මක කරනු ලබන කොළඹ තදාසන්න දුම්රිය සේවය සඳහා විදුලි දුම්රිය සේවා ඇරඹීම.

අභියෝග

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව මුහුණදෙන ප්‍රධානතම අභියෝගය හා ගැටළු අතර ප්‍රවේශපත්‍ර ගාස්තු ප්‍රධාන තැනක් ගනී.
මීට අමතරව පුනරාවර්තන වියදම් ඉහලයාම , සේවක ගැටළු , ප්‍රතිපාදන සීමා වීම් ආදී අභියෝග හා ගැටළු මධ්‍යයේ වුවද දෛනික මගී හා භාණ්ඩ ප්‍රවාහන කටයුතු වල නියැලී සිටී

මූල්‍ය ප්‍රගතිය

2020 වසරේදී ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව උපයාගත් ආදායම් හා වියදම් පිළිබඳ තොරතුරු පහත වගුවෙන් දක්වා ඇත.

2020 වසරේ ආදායම් වර්ගීකරණය

#	ආදායම් කාණ්ඩය	ආදායම (රු.මි.) 2020
01	මගී	3,481.53
02	පාර්සල් සහ තැපැල්	89.09
03	භාණ්ඩ හා පශු සම්පත්	364.77
04	වෙනත්	631.24
එකතුව		**4,566.64**

වගු අංක 04

2020 වසරේ වියදම

වියදම් කාණ්ඩය	වියදම රු.මි
පුනරාවර්ථන වියදම	14,617.45
ප්‍රාග්ධන වියදම	34,119.51
එකතුව	**48,736.96**

වගු අංක 05

දුම්රිය ඇණිය

ඉන්දීය ණය ආධාර ක්‍රමය යටතේ ඉන්දියාවෙන් ආනයනය කරන ලද එස් 13 බලවේග කට්ටල් 6 නගරාන්තර දුම්රියන් සඳහා ධාවනයේ යොදවා ඇති අතර, එම් 11 වර්ගයේ එංජින් 10 ම මගී ප්‍රවාහන කටයුතු සඳහා යොදා ගෙන ඇත

මීට අමතරව 2020 වසර අග වන විට උඩරට දුම්රිය මාර්ගය සඳහා චීනයෙන් ආනයනය කරන ලද එස් 14 බලවේග කට්ටල 09 ම උඩරට මාර්ගයේ ධාවන කටයුතු සඳහා යොදවන ලදී.

2020 වර්ෂයේ පැවති කොරෝනා තත්වය හමුවේ වුවද දුම්රිය සේවය සඳහා විශාල කාර්ය භාරයක් දුම්රිය ඇණිය විසින් සපයන ලදී. එසේ වුවද පැවති කොරෝනා තත්වය හේතුවෙන් දුම්රිය ගමන්වාර ප්‍රමාණය සිමා කරන ලදී. ඒතුළ දුම්රිය ඇණියේ සම්පූර්ණ ධාරිතාවය ප්‍රයෝජනයට ගැනීමට නොහැකි විය. 2020 වර්ෂය අවසන් වන විට සේවය සඳහා යොදවා තිබූ සාමාන්‍ය දුම්රිය ඇණිය පහත පරිදි දැක්විය හැකිය.

දුම්රිය ඇණිය

අංකය	වර්ගය	සංඛ්‍යාව
01	දුම්රිය එංජින්	73
02	බලවේග කට්ටල Single Rakes Double Rakes	 39 18
03	මගී මැදිරි මැදිරි බලවේග කට්ටල් මැදිරි	1487 876 611
04	ගැල්	492

වගු අංක 06

මගී මැදිරි සහ දුම්රිය එන්ජින් අලුත්වැඩියාව සහ නඩත්තුව අඛණ්ඩව සිදු කිරීම තුළින් 2020 වර්ෂය තුළ දුම්රිය ඇණිය සඳහා සුළු අලුත්වැඩියාවන් 26,706 ක් හා මහාපරිමාන අලුත්වැඩියාවන් 2,192 නිම කර ඇත. තවද පුනරුත්ථාපනය කරන ලද මගී මැදිරි 23 ක් ද සේවයට එක් කිරීමට හැකි විය.

මීට අමතරව භාවිතයෙන් ඉවත් කරන ලද මගී මැදිරි 200 පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ 2020 වසර අවසන් වන විට මගී මැදිරි190 ක් පුනරුත්ථාපන කටයුතු සිදුකර අවසන් කරන ලදී. ඒ අතරින් රුමේනියන් මැදිරි 138 ක් හා එස් 8 බලවේග කට්ටල මැදිරි 52ක් පුනරුත්ථාපනය සිදුකර ධාවන කටයුතු සඳහා ද යොදවා ඇත.

මගී හා භාණ්ඩ ප්‍රවාහනය

2019 වර්ෂයේ මගීන් මිලියන 128.48 ක් දුම්රියෙන් ගමන් කරන ලද අතර 2020 වර්ෂයේදී 65.08 ගමන් කර ඇත. එය 2019 වර්ෂයට සාපේක්ෂව 49.34 % ක අඩු වීමක් දක්වයි. මෙලෙස මගීන් ගේ අඩුවීම සඳහා ප්‍රධාන ලෙසම බලපාන ලද කරුණු වුයේ 2020 වසර පුරාවටම ඇතිවූ කොරෝනා තත්වය මත මාර්තු මස සිට ජුනි මස දක්වා රට වරින් වර වසා තිබීමයි. ඒ තුළ සියළුම දුම්රිය ගමන් වාරයන් අවලංගු කරන ලදී. එමෙන්ම ජූලි , අගෝස්තු සැප්තැම්බර් , ඔක්තෝබර් මාස වල සීමා සහිත තත්වයන් තුළ දුම්රිය ධාවනය සිදුවූ අතර නැවතත් ඔක්තෝබර් නොවැම්බර් දෙසැම්බර් මාසයන් වල වරින් වර රටේ කලාප වශයෙන් තෝරා වැසීම තුළ දුම්රිය ධාවන වාර ප්‍රමාණයන්ද සීමා සහිත තත්වයක් තුළ සිදු කරන ලදී .මෙම තත්වය තුළ 2019 වසරට සාපේක්ෂව 2020 වසර තුළ මගී සංඛ්‍යාව 49.34% ද මගී ආදායම 45.49 % ද මගී කිලෝමීටර් ප්‍රමාණය 45.56% ද සැලකියයුතු අඩුවීමක් පෙන්නුම් කරයි.

ගමන්කළ මගී සංඛ්‍යාව හා මගී ආදායම

වර්ෂය	ගමන්කළ මගීන් සංඛ්‍යාව (මි)	මගී ආදායම රු. (මි)	මගී කි.මී (මි)
2019	128.48	6,386.96	7,309.56
2020	65.08	3,481.53	3,905.55

වගු අංක 07

භාණ්ඩ ආදායම හා ප්‍රවාහනය කරන ලද භාණ්ඩ ප්‍රමාණය

වර්ෂය	භාණ්ඩ ආදායම රු.(මි)	භාණ්ඩ ප්‍රමාණය (ටොන් මි.)	ටොන් කිලෝමීටර් ප්‍රමාණය (මි)
2019	435.02	1.80	115.62
2020	364.77	1.78	114.37

වගු අංක 08

- 2020 වර්ෂයේ භාණ්ඩ ප්‍රවාහන කටයුතු පිළිබඳව සැලකීමේදී භාණ්ඩ ප්‍රවාහන ආදායම 16.14 % ක්ද භාණ්ඩ ටොන් ප්‍රමාණය 4.81 % ක් හා ටොන් කිලෝමීටර් ප්‍රමාණය 1.08 % ප්‍රමාණයක අඩුවීමක් පෙන්නුම් කරයි. කෝවිඩ් තත්වය හමුවේ වුවද තෙල් ප්‍රවාහන කටයුතු අඛණ්ඩව සිදුකිරීම මෙයට ඉවහල් විය.

මෙහෙයුම් දර්ශකය

අංකය	කාර්ය සාධන දර්ශකය	2019	2020
01	දුම්රිය ආදායම (රු.මි.)	7,901.32	3,481.53
04	ගමන් කළ මගී සංඛ්‍යාව (මිලියන)	128.48	65.08
03	මගී කි.මී. ප්‍රමාණය (මිලියන)	7,309.56	3,905.55
04	ප්‍රවාහනය කළ භාණ්ඩ ටොන් ප්‍රමාණය (මිලියන)	1.80	1.78
05	භාණ්ඩ ටොන් කි.මී. (මිලියන)	115.62	114.37

වගු අංක 09

සමස්ථ දුම්රිය ධාවනය

දුම්රිය සේවය	සැලසුම් කළ දුම්රිය සංඛ්‍යාව	ධාවනය වූ දුම්රිය සංඛ්‍යාව
තදාසන්න	50,632	45,623
ප්‍රාදේශීය	21,135	18,895
දුරස්ථ හා නගරාන්තර	15,724	14,779
රේල් බස්	2,911	2,063
i මගී	**90,402**	**81,360**
ii භාණ්ඩ	**6,806**	**4,891**
එකතුව	**97,208**	**86,251**

වගු අංක 10

ඉහත වගු අංක 10හි දැක්වෙන තොරතුරු අනුව 2020 වසර තුළ ධාවනය සඳහා සැලසුම් කළ මගී දුම්රිය සංඛ්‍යාව 90, 402 ක් වූ අතර එයින් 81,360 ක් ධාවනය කර ඇත. එය ප්‍රතිශතයක් ලෙස ගත් විට 89 % කි. මගී හා භාණ්ඩ දුම්රිය ධාවන කටයුතු අඩුවීමට කෝවිඩ් ව්‍යාප්තිය හේතුවෙන් ඇදිරිනීතිය දැමීම හා රට වසාදැමීමත් සමඟ එම තත්වයන් අනුව දුම්රිය ගමන්වාර සීමා කිරීමත් සෘජුවම බලපාන ලදී.

ඉන්ධන භාවිතය

දුම්රිය එංජින් හා බලවේග කට්ටල සඳහා පහත පරිදි ඉන්ධන භාවිතා කර ඇත.

විස්තරය	2019	2020
ඩීසල් ලීටර් මිලියන	33.92	26.32
ඉන්ධන සඳහා වියදම (රු.මි)	4,315.60	3,113.29

වගු අංක 11

2020 වර්ෂයේ ඉන්ධන භාවිතය ලීටර් මිලියන 26.32 ක් වූ අතර ඒ සඳහා රු.මි. 3,113.29 ක වියදමක් දැරීමට සිදු විය. 2020 වර්ෂයට සාපේක්ෂව 2019 වර්ෂයේ භාවිතා කරන ලද ඉන්ධන ලීටර් මිලියන 7.60 ක ප්‍රමාණයේ අඩුවීමක් හඳුනාගත හැකි අතර එයට බලපාන ලද ප්‍රධානතම සාධක වූයේ මෙම වසරේ මාර්තු මස සිට ජුනි මස දක්වා කොරෝනා තත්වය හේතුවෙන් රට වසා තැබීමත් ඒ තුල දුම්රිය ධාවනය නවත්වා තිබීමය. එමෙන්ම ඔක්තෝබර් මස සිට දෙසැම්බර් දක්වා ද දුම්රිය ධාවනය සීමාසහිතව සිදු කරන ලදි.

ස්ථිර මාර්ග පද්ධතිය හා ගොඩනැගිලි

ස්ථිර මාර්ග පද්ධතියේ නඩත්තු කටයුතු හා වැඩිදියුණු කිරීම් අඛණ්ඩව ක්‍රියාත්මක කළ අතර ඒ සඳහා රේල් පීලි මීටර් 39,143.66 ක් ද කොන්ක්‍රීට් සිල්පර 36,739 ක්ද දැව සිල්පර 57,239 ක්ද බැලස්ට් කියුබ් 17,117 ක් ද භාවිතා කෙරිණි.

දුම්රිය මාර්ග නඩත්තුව සඳහා උපයෝගි කර ගත් ද්‍රව්‍ය

යොදා ගත් ද්‍රව්‍ය	ප්‍රමාණය
රේල් පීලි (මීටර්)	39,143.66
දැව සිල්පර	57,239
වානේ සිල්පර	477
කොන්ක්‍රීට් සිල්පර	36,739
බැලස්ට් කියුබ්	17,117

වගු අංක 12

පුත්තලම දුම්රිය මාර්ගයේ කුරණ සිට මීගමුව දක්වා ද්විත්ව දුම්රිය මාර්ගය ඉදි කිරීම් කටයුතු සිදු කරනු ලබන අතර ,මහව ඕමන්ත දුම්රිය මාර්ගය පුනරුත්ථාපනය කිරීමේ කටයුතු ආරම්භ කිරීම, පොල්ගහවෙල සිට කුරුණෑගල දක්වා ද්විත්ව දුම්රිය මාර්ගය මූලික කටයුතු හා මහනුවර - පේරාදෙණිය - කඩුගන්නාව මාර්ගයේ මූලික කටයුතු ද , දකුණු පයාගල සිට අළුත්ගම දක්වා ද්විත්ව දුම්රිය මාර්ගයේ ඉදිකිරීමේ මූලික කටයුතු ක්‍රියාත්මක කරන ලදී. දුම්රිය ස්ථාන ගොඩනැගිලි අලුත්වැඩියාව හා නඩත්තු කටයුතු නිම කිරීම, ඔස්ට්‍රියානු රජයේ ණය ආධාර යටතේ නව කැළණි පාළම ඉදි කිරීමට කැබිනට් අනුමැතිය ලැබී ඇති අතර, එහි මූලික කටයුතු සිදු කරමින් පවතී.
2020 වර්ෂයේදී වේගසීමා ඉවත්කර කාර්යක්ෂම දුම්රිය සේවාවක් පවත්වාගෙන යාම සඳහා කටයුතු කරන ලදී.

අංකය	මාර්ගය	ඉවත් කළ වේග සීමා	
		2019	2020
01	මධ්‍යම දිස්ත්‍රික්කය	40	20
02	පහළ දිස්ත්‍රික්කය	44	14
03	ඉහළ දිස්ත්‍රික්කය	39	8
04	උතුරු දිස්ත්‍රික්කය	10	1
05	නැගෙනහිර දිස්ත්‍රික්කය	80	67
එකතුව		**213**	**110**

වගු අංක 13

2020 වර්ෂයේ වේග සීමා 110 ක් පමණ ඉවත් කිරීමට හැකි වී ඇත . වේග සීමා ඉවත් කිරීම තුළින් ස්ථාවර වේගයක් යටතේ දුම්රියට ගමන් කිරීමට හැකිවීම තුළින් නියමිත වේලාවට දුම්රිය ගමනාන්තය දක්වා ලඟාවීමට හැකියාව ලැබේ. ඒතුළ වඩා කාර්යක්ෂම දුම්රිය ප්‍රවාහන සේවාවක් මගී ජනතාව වෙත ලබා දීමට හැකියාව ලැබේ. 2019 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂයේ ඉවත් කරන ලද වේගසීමා ප්‍රමාණයේ 103 ක අඩුවීමක් පෙන්නුම් කරනු ලබයි. 2020 වර්ෂය පුරාම පැවතිනු ලැබූ කොවිඩ් තත්වය හේතුවෙන් මෙම වේගසීමා ඉවත්කිරීමේ තත්වයේ පහල යාමක් හඳුනාගත හැකිය.

සංඥා හා විදුලි සංදේශ පද්ධතිය

ආරක්ෂාකාරී හා කාර්යක්ෂම දුම්රිය සේවාවක් පවත්වා ගැනීම සඳහා දුම්රිය සංඥා පද්ධතියේ ක්‍රියාකාරිත්වය ඉතා වැදගත් වේ. කි.මී 1479.51 වන ශ්‍රී ලංකාවේ දැනට පවතින දුම්රිය මාර්ග පද්ධතිය පුරා පිහිටා ඇති දුම්රිය ස්ථාන 418 වන අතර එම සියළු දුම්රිය ස්ථාන සඳහා පිහිටුවා ඇති සංඥා පද්ධති නිසි ලෙස නඩත්තු කර යථා ක්‍රියාකාරී මට්ටමකින් පවත්වා ගැනීම සංඥා හා විදුලි සංදේශ උප දෙපාර්තමේන්තුවට අයත් ප්‍රධාන කාර්යභාරය වේ. එමෙන්ම මේ වන විට දුම්රිය මාර්ග පද්ධතිය පුරා පිහිටුවා ඇති ක්‍රියාකාරී දුම්රිය හරස් මාර්ග ආරක්ෂණ පද්ධති සංඛ්‍යාව 700 කට අධික වන අතර ඒවාද නිසි ලෙස නඩත්තු කර නිසි ක්‍රියාකාරී මට්ටමක පවත්වා ගැනීමද සිදු කරනු ලැබේ.

සංඥා හා විදුලි සංදේශ පද්ධතියේ මනා නඩත්තු හා නවිකරණ කටයුතු දුම්රිය සේවයේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා මනා පිටුවහලක් සපයයි. වසර පුරා පැවති කොවිඩ් වසංගත තත්වය හමුවේ වුවද පෙර වසර වල මෙන්ම 2020 වර්ෂය තුළ දී ද සංඥා හා විදුලි සංදේශ පද්ධතියේ ක්‍රියාකාරිත්වය ඉහළ මට්ටමකින් පවත්වා ගැනීම සඳහා සංඥා හා විදුලි උප දෙපාර්තමේන්තුව විශාල කාර්යභාරයක් සිදුකරන ලදී.

තවද , 2020 වසරේදි සංඥා දෙපාර්තමේන්තුව මගින්

1. පොල්ගහවෙල සිට මහව දක්වා පැවති සැමෝෆෝන් සංඥා පද්ධති වෙනුවට නව සංඥා පද්ධතියක් සවි කිරීම
2. පොතුහැර සිට කුරුණෑගල දක්වා 2019 වර්ෂයේදී ආරම්භ කරන ලද නව ස්වංක්‍රීය බ්ලොක් සංඥා ක්‍රමය ස්ථාපිත කිරීම 2020 වර්ෂයේදි සම්පූර්ණ කරන ලදි.
   මේ තුළ එකම දිශාවට දුම්රියක් ධාවනය කරන විට පෙර පැවති විනාඩි 18 ක කාලය මිනිත්තු 5 ක් දක්වා අඩුකිරීමට හැකිවිය.

මහරගම සිට නුගේගොඩ දක්වා පැවති Tablet ක්‍රමය ඉවත්කර නව ස්වයංක්‍රීය බ්ලොක් සංඥා ක්‍රමය ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. මහරගම දුම්රිය ස්ථානයේ ධාවනාගාරයේ පැවති සංඥා ක්‍රමය වෙනුවට පරිගනක තාක්ෂණය සමඟ සම්බන්ධ වන වඩා කාර්යක්ෂම සංඥා පද්ධතියක් ස්ථාපිත කරන ලදී. මේ සඳහා වැයවූ වියදම රු.මි. 40 ක් පමණ වූ අතර එමගින් රුපියල් මිලියන 300 කට වඩා ඉතිරි කර ගැනිමට දෙපාර්තමේන්තුවට හැකිවිය

එමෙන්ම පුත්තලම් මාර්ගයේ සීදුව හා ප්‍රීමා පැති මාර්ගය සම්බන්ධ කරමින් මාර්ග සංඥා නවිකරණය කිරිම සිදු කරන ලදී. පුහුණු ශ්‍රමිකයන්ගේ හා මුල්‍ය ඌනතාවයන් යටතේ වුවද 2020 වසරේදී ත් කිලෝමීටර් 637 දිග මුළු විදුලි හා ඉලෙක්ට්‍රෝණික පාදක වර්ණ සංඥා පද්ධතිය සහ කිලෝමීටර් 800 ක් දිග යාන්ත්‍රික සංඥා පද්ධතිය සාර්ථකව නඩත්තු කරමින් කාර්යක්ෂම දුම්රිය ධාවනයක් පවත්වාගෙන යන ලදී. එමෙන්ම ක්‍රියාත්මක වෙමින් පවතින ලද දුම්රිය මාර්ග ආරක්ෂණ පද්ධති 200 ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය යටතේ ආරක්ෂණ පද්ධති 200 ක් ස්ථාපිත කරන ලදී. ඊට අමතරව නව විදුලි සංඥා ආරක්ෂිත පද්ධති 200 ක් ලබා ගැනිම සඳහා කටයුතු සිදු කරනු ලැබිය.

වාණිජ කටයුතු

දුම්රිය දෙපාර්තමේන්තුවේ ආදායම් කටයුතු ඉහල නැංවීම සඳහා දුම්රිය වාණිජ කටයුතු 2020 වර්ෂයේදී ද ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව 2020 වර්ෂය තුළ දුම්රිය අදායම් තත්වය වර්ධනය කිරීම සඳහා (මගී හා මගී නොවන) පහත සඳහන් කාර්යයන් ක්‍රියාත්මක කරන ලදී.

දුම්රිය දෙපාර්තමේන්තුවේ වාණිජමය කටයුතු වලදී මහජනතාව සමඟ සෘජුව කටයුතු කරන අතර මහජනතාවගේ ඉල්ලීම් අනුව, පැවති කොරෝනා තත්වය හමුවේද දුම්රිය ධාවන හා මෙහෙයුම් කටයුතු වලට බාධාවක් ඇති නොවන පරිදි දෙපාර්තමේන්තුව සතු සම්පත් උපරිම අයුරින් ප්‍රයෝජනයට ගනිමින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් පරිදි දෙපාර්තමේන්තු අදායම වැඩිකිරීමට දායක විය.

මීට අමතරව දුම්රිය දෙපාර්තමේන්තුව මගින් විවේක කාමර සහ සංචාරක බංගලාවල ආදායම් තත්වය ඉහල නංවා ගැනීම සහ පාරිභෝගික ආකර්ෂණය උදෙසා ඊට අවශ්‍ය පහසුකම් සපයනු ලැබේ. එමෙන්ම නිවාඩු නිකේතන වලින් කාර්යක්ෂම සේවයක් මහජනතාව වෙනුවෙන් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය භෞතික සම්පත් ලබාදීම සිදුකරණු ලැබේ. මීට අමතරව දුම්රිය මගීන්ට සිදුවන අනතුරු සඳහා අනතුරේ ස්වභාවය අනුව වන්දි ගෙවීමට ද අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබීය. ඊට අමතරව ,

- මඩකලපුවේ සිට කොළඹ දක්වා දුම්රියෙන් වැලි ප්‍රවාහනය සිදු කිරීම
- චීන වරායේ සිට සීදුව දක්වා ප්‍රීමා පිටි ප්‍රවාහන කටයුතු සිදු කිරීම සඳහා සැළසුම් සකස් කිරීම
- Q Shop අළෙවිසැල් ආරම්භ කිරීමට සැළසුම් කර ඇත.
- වන වාසල සිට පුත්තලම දක්වා කසල ප්‍රවාහනයට සැළසුම් කිරීම
- චීන වරායේ සිට පොළොන්නරුව දක්වාත් කොළඹ සිට පොළොන්නරුව දක්වාත් දුම්රිය මගින් පොහොර ප්‍රවාහන කටයුතු සැළසුම් කිරීම
- නානුඔය සිට කොළඹ දක්වා කෘෂි නිෂ්පාදන දුම්රිය මගින් ප්‍රවාහනය කිරීමට සැළසුම් කිරීම

ආදී කටයුතු 2020 වර්ෂය තුළ සිදු කරන ලදී.

මගී පහසුකම් හා වෙනත් සංවර්ධන කටයුතු

2020 වර්ෂයේදී දුම්රිය ස්ථාන සංවර්ධනය කිරීම මඟින් මගී පහසුකම් ඇති කිරීම සඳහා ක්‍රියාමාර්ග රාශියක් ගත් අතර ඉන් කීපයක් පහත සඳහන් පරිදි දැක්විය හැක.

- ආබාධිත මගීන් සඳහා පහසුකම් සංවර්ධනය කිරීම (රෝද පුටු, ආබාධිත පුද්ගලයින්ට ගමන් කිරීම සඳහා මංතීරු ඉදි කිරීම, වැසිකිලි පහසුකම් ඇති කිරීම, ආබාධිත ප්‍රවේශ මාර්ග ඇති කිරීම)
- දුම්රිය ස්ථාන විවේක කාමර නවීකරණය හා ඒවා මගීන්ට පහසුවෙන් වෙන් කර ගත හැකි වන ක්‍රමවේද සැකසීම
- නව දුම්රිය හා මගී පාළම්,දුම්රිය ස්ථාන වේදිකා ඉස්සීම හා දීර්ඝ කිරීම , දුම්රිය ස්ථාන ගොඩනැගිලි නඩත්තු කටයුතු
- නව දුම්රිය සේවා හඳුන්වා දීම
- නගරාන්තර දුම්රියන්ගෙන් ගමන් කිරීමට ප්‍රවේශපත් වෙන් කරවා ගැනීමට අවශ්‍ය කටයුතු වැඩි දියුණු කිරීම
- සුළු අළෙවිසැල්, කඩ කාමර, රථ ගාල් වැනි අංග ඇති කිරීමෙන් දුම්රිය මගීන්ට අමතර සේවාවන් ලබා දීම
- දුම්රිය මගින් භාණ්ඩ ප්‍රවාහන කටයුතු වැඩි දියුණු කිරීම

ශ්‍රී ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය

ගුණාත්මක කාර්මික ශිල්පීන් බිහි කිරීමේ අරමුණෙන් පවත්වාගෙන යනු ලබන ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය සිය කාර්යභාරය 2020 වර්ෂයේදී ද අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදි. පුහුණුව ලබන සිසුන්ගේ ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වීම සඳහා යටිතල පහසුකම් සැපයීම, ව්‍යෘත්තීය පරීක්ෂණ සඳහා පහසුකම් සැලසීම, ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ පුහුණු වන ආධුනිකයන්ගේ ඇගයීම් කටයුතු සිදු කිරීම, විශ්ව විද්‍යාල සිසුන්ගේ වැඩ බිම් පුහුණු අධීක්ෂණ කටයුතු සිදු කිරීම ආදී කාර්යයන් මෙමඟින් සිදු කොට ඇත.

එමෙන්ම පාසල් හැරගිය සිසුන් සඳහා තෘතියික හා ව්‍යෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාවේ අනුමැතිය යටතේ ජාතික පුහුණු සම්මතයන්ට අනුව පූර්ණකාලීන පාඨමාලා පවත්වමින් දෙපාර්තමේන්තුවට හා රටට අවශ්‍ය ශ්‍රම බලකායක් බිහිකරන ලදී

මෙම ආයතනය මඟින් කරගෙන යනු ලබන පාඨමාලා ප්‍රධාන වශයෙන් පහත ආකාරයෙන් ක්‍රියාත්මක කරන ලදි. ජාතික වෘත්තීය සුදුසුකම් (National Vocational Qualification) ඇතුළත් පූර්ණකාලීන පාඨමාලා මේ යටතේ පවත්වාගෙන යනු ලබයි.

